හිතවත් බැංකු ගනුදෙනුකරුවනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ දැක්වෙන නියමයකට අනුව, අපගේ බැංකුව විසින් මූලික කරුණු අන්තර්ගත ලේඛන (Key Fact Documents) මාලාවක් සකස් කර ඇති අතර. ඔබට අවශ්‍ය වන සහ ඔබට සුදුසු වන පරිදි අපගේ බැංකුව විසින් සපයන බැංකු ගිණුම් පහසුකම්/සේවාවන් තෝරාගැනීම පිණිස ඔබට සහාය වීමට එකී ලේඛන මාලාවෙන් අපේක්පා කරනු ලැබේ.

පෞද්ගලික බැංකු කටයුතු සඳහා නේපන්ස් ට්‍රස්ට් බැන්ක් හි තිබෙන ගිණුම් ආශ්‍රිත සුවිශේප පැකේජ සහිත විවිධ වර්ගයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පිළිබඳව සහ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව පුළුල් සංක්පිප්ත විස්තරයක් මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයෙන් ඔබ වෙත සපයනු ලැබේ.

කෙසේ වුව ද, මෙම මූලික කරුණු අන්තර්ගත ලේඛනයේ සඳහන් කාරණාවන් නෛතික සහ නියාමන වෙනස්කම්වලට අනුව සහ අපගේ බැංකුවේ ප්‍රතිපත්තිවල සහ කාර්ය පටිපාටිවල සිදුවන වෙනස්ම්වලට අනුකූලව ප්‍රතිශෝධනය වීමක් අවශ්‍ය වියහැකි බව කරුණාවෙන් සලකන්න.

මේ පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබාගැනීමට ඔබ අපේක්පා කරන්නේ නම්, කරුණාකර www.nationstrust.com වෙබ් අඩවියට පිවිස හෝ 0114 711 411 දරන දුරකථන අංකයෙන් හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඔස්සේ අප බැංකුව ඇමතීමට කාරුණික වන්න.

පහත සඳහන් ඔබගේ යම් කවරම වූ ගිණුමක් සම්බන්ධයෙන් යම් කවරම වූ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට ඇත්නම්, එම පැමිණිල්ල පිළිබඳ දැන්වීම අඩංගු ලුහුඩු ලිඛිත ප්‍රකාශයක් අප බැංකුවේ ;

**පැමිණිලි විසඳීමේ නිලධාරී, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට භාරදීමෙන් හෝ දුරකථන අංක **[+94(0)11 4711411]** ඔස්සේ අප ඇමතීමෙන් හෝ customersesrvice@nationstrust.com යන විද්‍යුත් තැපැලට යොමු කිරීමෙන් දැනුම් දිය හැකි අතර, ඒ පිළිබඳව අප බැංකුව විසින් ඔබ වෙත ක්පණිකවම ප්‍රතිචාර දක්වන්නෙමු.

| **ගිණුම පිළිබඳ විස්තරය** | **බැංකු ගණුදෙනුකරුවන්ට අත්වන වාසි** | ගාස්තු වර්ග සහ බැංකුව විසින් පනවන වෙනත් අයකිරීම් | **ගිණුම විවෘත කිරීම පිණිස අනුගමනය කළයුතු කාර්ය පටිපාටි** | **ප්‍රධාන නියමයන් සහ කොන්දේසි** |
|---|---|---|---|---|
| **කාලීන තැන්පතු** | | | | |
| **නේෂන්ස් ස්ථාවර තැන්පතු (Nations Fixed Deposits)** | පොලී අනුපාතය සඳහා 1 වන මාසයෙන් ආරම්භ වී 60 වන මාසය දක්වා වන වලංගු කාලසීමාව පදනම් කරගනු ලැබේ.<br>පොලිය බැංකු ගණුදෙනුකරුගේ මනාපය පරිදි, කල්පිරීම මත හෝ මාසිකව හෝ වාර්පිකව ගෙවනු ලැබේ.<br><br>දින 30 සිට දින 365 ඇතුළත, නියම කරන දින ගණනනක් මත රැඳෙමින් ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමේ මනාපය.<br><br>ස්ථාවර තැන්පතුවේ වටිනාකමින් 90% ක් දක්වා බැංකු අයිරා සහ ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව. | ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාමට බැකුව විසින් අයකිරීම් නොකරයි. | කාලීන තැන්පතු විවෘත කිරීම සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය.<br><br>• ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්පි අවශ්‍ය වනු ලැබේ. | සුදුසුකම් නිර්ණායක:<br><br>• වයස අවුරුදු 18 ට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි, වලංගු ජාතික හැඳුනුම්පතක් / වලංගු ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයෙකු වීම.<br><br>• ගිණුමේ අවම ශේෂය රුපියල් 50,000 ක් විය යුතුය.<br>• ආයෝජනයේ දින සිට දින 30කට නිදහස් කරගැනීම සිදු කළහොත්, (ආයෝජනයේ දිනය ඇතුළුව වන නමුත් නිදහස් කරගැනීමේ දිනය හැර.) පොලිය ගෙවනු නොලැබේ.<br><br>• ස්ථාවර තැන්පතුව එය කල්පිරීමේ දිනයට පෙර නිදහස් කරගැනීම සිදුකළහොත්, ගෙවිය යුතු පොලිය එකඟ වූ අනුපාතයකට වඩා අඩු අනුපාතයකින් සහ බැංකුවේ අභිමතය පරිදි ගණනය කරනු ලැබේ.<br><br>• ස්ථාවර තැන්පතුව එය කල්පිරීමේ දිනයට පෙර නිදහස් කරගැනීම පිණිස ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් සහ එම ඉල්ලීම කරන විටත් පොලිය මාසික පදනමකින් බැංකු ගණුදෙනුකරු වෙත ගෙවා ඇත්නම්, එපරිදි කල්ඉකුත් වීමට පෙර නිදහස් කරගැනීම සඳහා වන ගාස්තුවක් ආරම්භක තැන්පතු මුදලෙන් අඩුකරගනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| **කැඳවුම් තැන්පතු<br>(Call Deposits)** | අවම දින 7ක් සඳහා පොලිය ගණනය කරන අතර. කල්පිරීමේ දී ගෙවනු ලැබේ. | කැඳවුම් තැන්පතුවක්<br>(Call Deposit) පවත්වාගෙන යාම සඳහා බැංකුව විසින් අයකිරීම් කරනු නොලැබේ. | කාලීන තැන්පතු විවෘත කිරීම සඳහා වන බැංකුවේ සම්මත ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත භාරදිය යුතුය.<br><br>• ජාතික හැඳුනුම්පතේ / වලංගු ගමන් බලපත්‍රයේ පිටපතක්.<br><br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ හෝ ගමන් බලපත්‍රයේ ලිපිනයෙන් වෙනස් වන විටක දී, ලිපිනය තහවුරු කරගැනීම පිණිස ලේඛනමය සාක්ෂි අවශ්‍ය වනු ලැබේ. | සුදුසුකම් නිර්ණායක:<br><br>• වයස අවුරුදු 18 ට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි, වලංගු ජාතික හැඳුනුම්පතක් / වලංගු ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයෙකු වීම.<br><br>• ගිණුමේ අවම ශේෂය රුපියල් 100,000 ක් විය යුතුය.<br><br>• අවම තැන්පතු කාලය දින 7 ක් වේ.<br><br>• තැන්පතුව එය අවම දින 7 ක කාලයට පෙර ඉවත් කරගැනීම සිදුකළහොත්, පොලිය ගෙවනු නොලැබේ. |

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, PQ 118, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.